# තේ තතු

පර්යේෂණ ක්ෂේත්‍රයේ 80 වසරක අභිමානය
80 வருட ஆய்வின் சாதனை
80 Years of Research Achievement

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි

ISSN - 1391- 6785

2005


## පස රැකීමෙන් අපිත් රැකෙමු

පස අපට සොබා දහම විසින් ලබා දෙනු ලැබූ අනර්ඝ දයාදයකි. නමුත් අද අපගේම නොසැලකිලිමත් ක්‍රියාකාරකම් නිසා පස සෝදා පාලුවට ලක් වී ඇත. අපගේ වගා ඉඩම් බොහොමයක් අද නිසරු බවට පත් වී ඇත්තේ පාංශු ඛාදනයේ ප්‍රතිඵලයක් ලෙසයි.

මිහිමත ජීවත් වන ජීවීන් වශයෙන් අප අපගේ පස දිවි හිමියෙන් සුරකිය යුතු අතර මේ වන විට එය අපගේ ජාතික වගකීමක් බවට පත් වී ඇත. මෑත කාලයේදී සිදු වූ සංවර්ධන ක්‍රියාවලියන්හි ප්‍රතිඵලයක් ලෙස බොහෝ වනාන්තර සෝදා පාලුවට ලක් වී ඇත. එමෙන්ම ඉදි කිරීම් ක්ෂේත්‍රයේ සිදු වූ සීඝ්‍ර සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස බොහෝ වගා බිම් පංශු ඛාදනයට ලක් වී නිසරු වී ඇත.

නමුත් අද වන විට අප විසින් අතීතයේ කරන ලද ක්‍රියාකාරකම් වල අනිසි ප්‍රතිඵල අපේ අනාගත පරම්පරාවට ඉතිරි කර ඇත. එමනිසා අපි දැන්වත් එය නිවැරදි කර ගැනිමට ප්‍රායෝගික ලෙස දායක වෙමු.

විශේෂයෙන්ම තේ වගාවේ ඉඩම් තෝරා ගැනිමේ සිට දළු නෙලන අවස්ථාව දක්වා ක්‍රියාවලියන් තුලදී පස සුරැකීම පිළිබද උනන්දු විය යුතුය. තේ වගාව සදහා ඉඩමක් තෝරා ගැනීමේදි නිතරම එහි බෑවුම 70% ට වඩා අඩු විය යුතු අතර විශේයෙන්ම එය මහවැලි ජලපෝෂිත ප්‍රදේශ වල සහ මැදරට සෙසු ප්‍රදේශවල 55% ට වඩා අඩු විය යුතුය. එමෙන්ම තේ නැවත වගාව සදහා තෝරාගත් ඉඩම් කොටසේ බිම් සකස් කිරීමේදි ඉඩමේ පහල සිට ඉහලට කල යුතුය. තවද මූලික බිම් සැකසීමේදී ප්‍රධාන කානු, නෙත්ති කානු සහ ගල්වැටි පිළිබද විශේෂ අවධානය යොමු කල යුතුය. ජෛව දෙවැටි ක්‍රමය මගින් අපගේ තේ ඉඩම් වල සිදු වන සෝදා පාලුව වලක්වා ගත හැකි අතර පස සශ්‍රීක වීමද සිදු වේ. එමෙන්ම වල් පැලෑටි පාලනය කිරීම සදහා උදලු සහ සොරඩි කිසිවිටකත් භාවිතා නොකල යුතු අතර ඒ සදහා ඒකාබද්ධ වල් පැලෑටි පාලන ක්‍රම අනුගමනය කිරීමෙන් වගා බිම් වල සිදුවන පාංශු ඛාදනය අවම කර ගත හැක.

සමහර තේ ඉඩම් වල ආර්ථික වශයෙන් ලාබදායි අර්තාපල් වැනි භෝග සිටුවීමට උනන්දුවක් දක්වයි. එමගින් නොදැනුවත්ම ලැබෙන කෙටි කාලීන ආර්ථික වාසියට වඩා දීර්ඝ කාලීනව සිදුවන ආර්ථික අවාසිය ඉමහත්ය. එයට හේතුව වන්නේ අර්තාපල් වගාවේදී සිදුවන පාංශු ඛාදනයේ ප්‍රතිඵලයක් ලෙස, පස නිසරු වී පසුව තේ වගාවේ ඵලදාව අඩු වීම සදහා එය බලපාන බැවිනි. එමනිසා ඔබගේ තේ වගාවේ පාංශු ඛාදනය වැලක්වීම සදහා තේ පර්යේෂණායතනය නිර්දේශ කරන ( ක්‍රම භාවිතයෙන් ඉඩමේ සරු භාවය පවත්වා ගත ා.

මිනිසාගේ මැදිහත් වීමේ ප්‍රතිඵලයක් ලෙස සිදුවන පාංශු ඛාදනය නිසා මිනිසුන් වන අප අනාගත මිනිස් පරපුරට දායක කරන්නේ නිසරු පසක් ද නැතහොත් අප මැදිහත් විමෙන් පස සුරකිනවාද යන්න තිරණය කිරිම අප සතු පරම යුතු කමකි.



*නැවත තේ වගාව සදහා සකසා ඇති ඉඩමක යොදා ඇති ජෛව දෙවැටි ක්‍රමය*

**හැරන් ජයවීර**